
# වජ්‍ර ප්‍රභා

## ශාස්ත්‍රීය සංග්‍රහය



හොරණ විද්‍යාරත්න විශ්ව විද්‍යාපීඨ වජ්‍ර ජයන්තිය

# වජ්‍ර ප්‍රභා

## ශාස්ත්‍රීය සංග්‍රහය

## 1929 - 2004

*උපදේශනය :*

විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨයේ ගරු කාර්‍යාධිකාරී, සිංහල ශබ්ද කෝෂයේ සම්මාන කර්තෘ, මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත, ආචාර්‍ය
හොරණ වජිරඥාණ නාහිමි.

හොරණ රජමහා විහාරාධිපති, රාජකීය පණ්ඩිත
හොරණ පඤ්ඤාසේකර මාහිමි.

විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨාධිපති, ශාස්ත්‍රපති
ඕපල්ලේ ඤාණසිරි ස්ථවිර.

ප්‍රාචීන භාෂා අංශාධිපති, රාජකීය පණ්ඩිත
ලත්පඳුරේ රාහුල ස්ථවිර.

*ප්‍රධාන සංස්කාරක :*

හොරණ විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨයේ ආචාර්‍ය
ශාස්ත්‍රපති නෙළුම්දණ්ඩේ විමලසාර ස්ථවිර.

*සහාය සංස්කාරකවරු :*

විදුර අබේනායක — එච්. ඩී. ආනන්ද
ජී. ධම්මික පරාක්‍රම — එච්. ටී. සාලිය කුමාර
සුරංග ප්‍රසාද්



2 - CM 4049

# ගෘහ සේවක සේවිකාවන් සහ ළමා සමාජානුයෝජනය

කථිකාචාර්ය ධර්ම කීර්ති ශ්‍රී රංජන්

ගෘහ සේවක සේවිකා සහ ළමා සමාජානුයෝජනය යනු ශ්‍රී ලාංකීය සමාජයේ පමණක් නොව විශ්වීය සමාජයේ පසුබිම් ව ගොඩනැංවී සාකච්ඡාවට භාජනය වන ප්‍රධාන මාතෘකාවකි. අතීත වර්තමාන සමාජාවලෝකනයක දී වුව බොහෝ පවුල් පරිසර පදනම් ව නිර්මාණය වන දිනචර්යාවේ ප්‍රධාන කොටස්කරුවන් බවට ගෘහ සේවක සේවිකාවන් පත්ව සිටින බැව් පෙනේ[1]. සමාජ විද්‍යාත්මක අධ්‍යයනයන්හිදී මෙය එතරම් ප්‍රශංසාවට පාත්‍රවන සිද්ධියක් නොවන්නේ කෘත්‍යාත්මක සාධක මෙන්ම දුෂ්කෘත්‍යාත්මක සාධක ද ඒ තුළ විද්‍යමාන වන බැවිනි. දාරක ජීව විද්‍යාත්මක හා සමාජීය සංවර්ධනය සහ ගෘහ සේවක සේවිකාවන් පවුල හා අනිවාර්ය සබඳතා ගොඩනංවා ගනිමින් ඉතා සියුම් ව නිශ්ශබ්දව හා උපක්‍රමශීලි ලෙසින් දාරක ජීව විද්‍යාත්මක හා සමාජීය සංවර්ධනය සඳහා ප්‍රමුඛ කාර්යයන් ඉටුකරන බව පැහැදිලි ය.

විශ්වීය සමාජයම නිදසුන් කොට ගනිමින් ලිඛිත අලිඛිත මූලාශ්‍ර පදනම්ව විද්‍යාත්මක ක්‍රමවේදයනට අනුගතව සාකච්ඡා වන මෙහි ප්‍රධාන අභිමතාර්ථය වන්නේ ගෘහ සේවක සේවිකාවන් සහ ඔවුනගේ චර්යා නිර්මාණය ළමා සමාජානුයෝජනය සඳහා කිනම් බලපෑමක් සිදුකෙරේ ද යන්න සොයා බැලීමයි. ඒ අනුව ගෘහ සේවක සේවිකාවන් යනු කවරහු ද? ඔවුනගේ වර්ග, ඔවුන් පවුල සහ දරුවා අතර ගොඩනගනු ලබන අන්තර් ක්‍රියාදාමය ළමා සමාජානුයෝජනයට ගෘහ සේවක සේවිකාවන්ගේ දායකත්වය ආදිය පිළිබඳව සාකච්ඡා කිරීමට අනුගත වීමය. ඒ අනුව ගොඩනගා ගත් ප්‍රධාන මාතෘකා කිහිපයක් ඔස්සේ සාකච්ඡාව මෙහෙයවීම මෙහි අභිලාෂය වේ.

### *ගෘහ සේවක සේවිකා වර්ගීකරණය (Type of servants) : –*

ගෘහ සේවක සේවිකා, පවුල සහ දරුවා (Servants, Family, Child) යනු එකිනෙකට ද්‍රව්‍යාත්මක, ජීව විද්‍යාත්මක, මානසික සහ සමාජීය

වශයෙන් අන්තර් ක්‍රියාදාමය දෘඩි වූ මූලික පදාර්ථ ත්‍රිත්වයක් ලෙස හැඳින්වීම ද නිවැරදි ය. මොවුන් හා සබැඳෙන සිද්ධීන් අධ්‍යයනය අතිශය වැදගත් වේ. මොවුන්ගේ සමාජ තත්ත්වය, කාර්යය සහ පවුල, දරුවන් හා සබඳතා නිර්මාණයෙහි ස්වභාවය ආදිය පදනම් ව ප්‍රධාන වර්ගීකරණයකට ලක් කළ හැකිය. එනම්,

I. ගෘහ සේවක සේවිකාවන් ආර්ථික, සමාජ, සංස්කෘතික, සාධක මූලික වූ සමාජ ස්ථරගත ස්වභාවය. (Social, Economic and Cultural States of Servants)

II. ගෘහ සේවක සේවිකාවන් සහ පවුල අතර සබඳතා නිර්මාණය වන ස්වභාවය (Nature of the relationships between family and servants) යනාදී වශයෙනි.

I. මෙහි ප්‍රථම වර්ගීකරණයෙහි සඳහන් ආර්ථික සාධක යනු ප්‍රබල සමාජ පන්ති නිර්මාණයකට අවශ්‍ය පසුබිම් සම්පාදනය කරන්නකි. විවිධ සමාජ ආර්ථික පන්තීන් නියෝජනය කරන සේවක සේවිකාවෝ සිටිති. මොවුනගේ කායික මානසික සහ සමාජීය හැකියා සමස්තයෙහි නිර්මාණය සඳහා මෙම සමාජ ආර්ථික පන්තිය පාදක පසුබිම නිර්මාණය කරයි. ඔවුනගෙන් සැපයෙන සේවාවට ද එය ප්‍රබල බලපෑමක් වේ.

ගෘහ සේවක සේවිකාවන්ගේ සමාජ ස්ථරගත ස්වභාවයෙහි තව ද ප්‍රබල සාධකයක් වන්නේ ආරෝපිත දිශානතියක් ඔස්සේ විහිදෙන ආත්මීය සංකල්පයක් ලෙස සැලකෙන දකුණු ආසියාතික සමාජයෙහි ප්‍රබල වන කුල (Caste) සාධකයයි. පුද්ගල හා සමාජීය නිර්මාණශීලිත්වය සඳහා සම්බාධක පැනවෙන සීමාන්තික චලනතාවයනට නැඹුරු වන කුල සාධකය සේව්‍ය-සේවක සබඳතාවන්හි සීමාසහිත ස්වභාවයක් නිර්මාණය කරයි.

ජාතිකත්වය ද ගෘහ සේවක සේවිකා වර්ගීකරණය සඳහා බලපාන තවද ප්‍රබල සංකල්පයකි. එංගලන්තය ඇමරිකාව වැනි රටවල ගෘහ සේවක සේවිකාවන් සඳහා බඳවා ගනු ලැබුවේ ඔවුන්ගේ ම ජාතිකයන් ය. ඇමරිකාවේ සමහර ප්‍රදේශවල එනම් නැගෙනහිර හා දකුණු

ප්‍රදේශවල නීග්‍රෝ (Negro) වැනි ජාතිකයන් සේවක සේවිකාවන් ලෙසින් බඳවා ගනු ලැබීය.[2] ශ්‍රී ලංකාවෙන් තෝරා ගන්නා ලද නියැදි සමීක්ෂණ අත්දැකීම් පාදක කර ගන්නා කල දැකිය හැක්කේ බොහෝ දුරට පහළ කුල සාමාජිකයන් සහ එම ජාතිකයන් මෙන්ම ද්‍රවිඩ මුස්ලිම් වැනි අනිකුත් ජාතිකයන් ද සේවක සේවිකාවන් ලෙසින් සම්බන්ධ වී සිටින ආකාරයයි. මේ අනුව කුල ජාති පදනම්ව නිර්මාණය වන සේව්‍ය සේවක සබඳතාවය (Employer-Employee Relationship) ඉතා ළංවූ මෙන්ම දුරස්ථ සබඳතාවයක් ලෙසින් ද දැකිය හැකිය.

පවුල සහ සබඳතා නිර්මාණය වන ස්වභාවය යනු සේව්‍ය-සේවක වර්ගීකරණයේ දෙවන සාධකයයි. සේවක සේවිකාවන් සේවය සපයනු ලබන පවුල් පරිසරය සහ සබැඳෙන ස්වරූපය කාලය අනුව ද මෙය සුවිශේෂී වනු ඇත. පාලක පන්තිය හා ඉතා කුළුපග ලෙන්ගතු සබඳතා ගොඩනංවන සහ එසේ නොවන සේවක සේවිකාවෝ ද සිටිති. සමහර සේවක සේවිකාවන්ගේ වෘත්තීයමය ආකල්ප පමණක් ම මූලික වේ. මොවුනගේ පවුල හා සබැඳෙන කාලය වෙනස් වේ. දිගු කාලයක් ම හෙවත් දිනය පුරාම සේවය සපයනු ලබන සේවක සේවිකාවන් පවුලේ චර්යාව සහ සාධනීය තත්ත්වයන් ගොඩනැංවීම සඳහා ප්‍රධාන කාරකයන් බවට පත්වේ.

සමස්ත සේවක සේවිකාවනගෙන් 10,33,772 ක් පමණ සේවක සේවිකාවන් ගෘහාශ්‍රිතව සේවය කොට ඇති බැව් 1940 ඇමරිකා එක්සත් ජනපදයේ පවත්වන ලද ජන සංගණනයෙහි සටහන් වී තිබුණි. නමුත් මොවුහු දිවා කාලයෙහි සේවය කොට රාත්‍රියෙහි විවේකය සහ නින්ද ගත කිරීම සඳහා ස්වකීය නිවෙස් දක්වා ගමන් කරයි.[3] අභ්‍යන්තරිකව වාසය කරන සහ බාහිරව වාසය කරමින් සේවය කරනු ලබන සේවක සේවිකාවන් අතර පුළුල් වෙනසක් දක්නට ලැබේ. අභ්‍යන්තරික ව සේවය කරන්නන් පවුල සහ දරුවන් අතර දිනය පුරාම අන්තර්ක්‍රියා පදනම්ව සබඳතා නිර්මාණය දක්නට ලැබෙන අතර බාහිර පරිසරයෙහි ජීවත් වන්නන් දිනයේ පැය කිහිපයක් පමණක් සබඳතා ගොඩනංවයි. භාවමය හැඟීම් පදනම් ව ගොඩ නැගෙන සබඳතා අභ්‍යන්තරික සේවක සේවිකාවන්ගෙන් බහුලව දක්නට ලැබිය හැකිය.

රැකියාවේ ස්වභාවය අනුව ද සේවක සේවිකා වර්ගීකරණය දැකිය හැකිය. නිදසුනක් ලෙස ගෘහ පාලන කළමනාකරුවන් (The household managers) සේවක සේවිකාවන් රැසක් සමගින් (Staff of servants) විශාල නිවෙස්වල සහ ව්‍යාපාරික ස්ථානවල සේවය කරනු දක්නට ලැබේ. ඔවුනගේ එම කටයුතු ඒකාබද්ධතා ස්වරූපයෙන් සිදු වේ. විශේෂීකරණය වූ සේවක සේවිකා වෘත්තීන් ද (Specialized Jobs) දක්නට ලැබේ. නිදසුන් ලෙස දරුවන් බලා ගන්නා මෙහෙකාරියන් (Nurse maid) දරුවන්ට සිය නිවසේ දී ශිල්ප ලබා දෙන ගුරුවරු ගුරුවරියන් (Teachers) ආහාර සම්පාදනය කරන්නන් (Cooks) රෙදි පිරිසිදු කරන කාන්තාවන් (Laundress) යනාදී වශයෙනි. මෙම වෘත්තීන්හි ස්වභාවය පදනම් ව සේවක සේවිකා සහ පවුල් අතර සබඳතාවය ද (Relationship between servants and family) සහ විශේෂයෙන් ම සේවක සේවිකාවන් සහ දරුවා (between servants and child) අතර සබඳතාව ද වර්ධනය වේ.

### *II. ගෘහ සේවක සේවිකා සහ පවුල් අන්තර් සබඳතාවය (Servants - Family Inter-relationship)*

ගෘහ සේවක සේවිකා සහ පවුල් අන්තර් සබඳතාවයේ ස්වභාවයන් පිළිබඳව විමසීම මෙම විෂය කොටසේ දී ඉතා වැදගත් වේ. මෙහි දී ප්‍රධාන කරුණු කිහිපයක් මුල් කොටගත හැකිය. ඒවා අතර,

#### 1. *ඥාතිත්ව රටා මූලිකව පවුල හා සබැඳෙන සේවක සේවිකාවන්*

මෙහිදී දුරස්ථ ඥාතිත්ව සබඳතාවය දක්නට ලැබීම විශේෂී ලක්ෂණ යයි. ඥාතීත්ව සබඳතා ඉතා ළංවන විට තමන්ගේ සේවක සේවිකාවන් ලෙස ඔවුන් බඳවා ගැනීමට මැලිකමක් දක්වයි. දුරස්ථ ඥාතිත්ව පදනමක් මත සේවක හෝ සේවිකා තත්ත්වයට පත්ව පවුලට උදව් කිරීමට පැමිණි මිතුරෙකු හෝ මිතුරියකු ලෙසින් ක්‍රියාත්මක වේ. ඥාතිත්ව රටා ක්‍රමය තුළ සේවක කාර්යභාරය දැඩි නොවේ. මේ පිළිබඳව සමාජීය හා ඥාතිත්ව පදනම මූලිකව කරුණු අවධාරණය කිරීමේ දී ඔවුන් දෙස සේව්‍ය-සේවක තත්ත්ව පදනමට වඩා සීමිත සමාජයම හා ඥාතිත්ව පදනමට අනුකූලව සබඳතා ගොඩනැංවීම විද්‍යමාන සාධකය වේ.

2. ***පවුලෙහිම සාමාජිකයෙකු හෝ සාමාජිකාවක (almost a member of the family) ලෙසින් කටයුතු කරන සේවක සේවිකාවන් :***

මොවුන් ඥාතීත්ව රටාවකට හෝ වෙනත් වෘත්තීමය වශයෙන් එළඹෙන පවුල් ගිවිසුම් (family bond) නොවේ. මොවුනගේ සේවය ඉතා සතුටුදායක මෙන්ම දිගු කාලීන වන විට පවුලේ සමාජීය තත්ත්වය සහ සම්ප්‍රදාය ආරක්ෂා වේ. මේ නිසා පිතෘ සම්ප්‍රදාය (paternalistic tradition) ඉදිරියට ගෙන යාමට ද හැකිවේ. නමුත් මෙහි දී සියුම් ලෙස එම සංස්කෘතික සම්ප්‍රදායන් වෙනස්වීමට හැකිය. පවුලේම සාමාජිකයෙකු යන සංකල්පය පදනම් වන කල ඉහළ සමාජ තත්ත්වයක් සේවක සේවිකාවන්ට හිමිවුවත් නිවසක සේවය සඳහා පැමිණි කළ ඔවුනගේ වඩා පහළ වෙනස්කම් සහිත චර්යා පද්ධතියක් අපේක්ෂා කරයි. එය පදනම්ව නිර්මාණය වූ ඉහළ මානසික තත්ත්ව සහ ධර්මතා බිඳ වැටුණු තත්ත්වයකට පත් වුව ද එම පවුලේම චර්යාත්මක තත්ත්වයන්හි සාමාජිකයෙකු බවට පත්වේ.

3. ***සේවක සේවිකා සහ පවුලේ කාර්ය සහයෝගිතාවය :***

සේවක හෝ සේවිකාව සමග ස්වාමියා හෝ ස්වාමි දියණිය එක් එක් කාර්ය සඳහා සහයෝගිතාවය ඇති කර ගනී. කාර්ය බහුල නිවෙස් වල මෙය විශේෂිය ලක්ෂණයයි. මෙම රටාව මුල්ව ඇය නිවසෙහි සේවිකාවකට වඩා අත්උදව්කරුවෙකු (helper) හෝ ගෘහපතිණිය හා සමාන සේවිකාවක බවට (fellow employee) පත් වන අතර සේවිකාව ගේම ස්වභාවය අවම වේ. ඒ අනුව මෙම තත්ත්වය සේවක හෝ සේවිකාව තුළ වෙනස්කම් නිර්මාණය කිරීමට හේතු වේ.

4. ***සේවක, සේවිකා-පවුල සහ දරුවා අතර දුරස්ථ සබඳතා තහවුරු වීම :***

සේවක සේවිකා - පවුල සහ දරුවා අතර දුරස්ථ සබඳතා තහවුරු වීම සඳහා පහත සඳහන් රටා නිර්මාණය දැකිය හැකිය. එනම් ඔවුනගේ වෙනස සහ කාර්යය විධිමත් කර ගැනීම අරමුණු කරගත් විශේෂ ඇඳුම් හෝ නිල ඇඳුම් (distinctive dress or uniform), සේවක සේවිකාවන්

සඳහා ඇතුළු වන සහ පිටවන ස්ථාන (servant's entrance), වෙනම ජීවත් වන කාමර (separate living room and quarters), ආදිය හැකිය. මෙම තත්ත්ව සේවක සේවිකාවන් සහ පවුල අතර සබඳතා දූරස්ථ කිරීම සඳහා සහ වෙනස් තත්ත්ව නිර්මාණය කිරීම සඳහා මෙන්ම වෙනස විධිමත් කිරීම සඳහා හේතු වන විධිමත් සාධකයෝ වෙති.

5. ***සමාජීය වශයෙන් දූරස්ථ වුව ද, පෞද්ගලික සබඳතාවයන්හි ඉතා දැඩි බවක් දැකිය හැකි වීම. (socially distinct but personally friendly relations)***

ජාති, කුල, පන්ති ආදී සාධක පදනම් ව සමාජීය දූරස්ථ රටා නිර්මාණය වුව ද පෞද්ගලික සබඳතා ගොඩනැංවීමේ දැඩි බවක් දක්නට ලැබෙන අවස්ථා ඇත. නිදසුන් ලෙස ඇමරිකාවේ සුදු කළු භේදය ප්‍රබල වුව ද දකුණු ඇමරිකාවේ සමහර සුදු ජාතික පවුල් නීග්‍රෝ ජාතික සේවක සේවිකාවන් සමග ඉතා පුළුල් පෞද්ගලික සබඳතා නිර්මාණය කොට ගෙන තිබුණි.[4] සුදු ජාතික ඉහළ පාන්තික පවුල්හි දිගු කාලයක් සේවය කළ කළු ජාතික සේවක සේවිකාවන්ට එම පවුල්වල ආධිපත්‍ය ද හිමි විය. එනම් ගෘහ කටයුතු, ළමුන් හා ආහාර ආදිය පිළිබඳ ආධිපත්‍ය මෙන්ම එම පවුල් සාමාජික සමාජිකයන් පිළිබඳව ද දැඩි සබඳතා නිර්මාණයක් ද වී තිබුණි.[5]

6. ***ඉහළ කුල සේවක සේවිකාවන් පහළ කුල, ඉහළ ආර්ථික පන්තියට සේවාවන් සිදු කිරීම***

ඉහළ කුල සේවක සේවිකාවන් පහළ කුල ඉහළ ආර්ථික පංතියට සේවක සේවිකාවන් ලෙසින් කටයුතු කරනු දැකිය හැකිය. නිදසුන් ලෙස ගොවිගම ඉහළ කුල සේවක සේවිකාවන් රෙදි සේදීමේ කාර්‍ය්‍ය කරන පහළ කුල සාමාජිකයනට සේවය කරන අවස්ථා ඇත. සේවක සේවිකාවන් තුළ මෙම කුලය නමැති සාධකය ආත්මීය වශයෙන් අභ්‍යන්තරීකරණය වී ඇත. මෙම තත්ත්වය සේවා කාලය තුළ සහ එම අවස්ථාවලින් පරිබාහිරව යම් ගැටලු සහ සිද්ධීන් ගොඩනංවන කල දැඩි කලකිරුණු ස්වභාවයක් ඔවුන් සිත් තුළ නිර්මාණය වේ. මෙම සංස්කෘතික සාධකය මුල්ව දූරස්ථ සබඳතා නිර්මාණය කරන

අතර ඔවුන්ගේ සේවය ලබා ගන්නන්ගේ පංතියට මනසින් පරිහව කරන අවස්ථා ද ඇත. බිඳවැටුණු මානසික ධර්මතා ද මෙහි තවද ලක්ෂණයකි.

මෙම ඉහත සාධක පිළිබඳ විමසිලිමත්වීමේ දී විද්‍යමාන වන්නේ සේවක සේවිකාවන් දාරක සමාජානුයෝජනයේ දී ඉතා වැදගත් කාරකයක් වන බවයි. ඔවුන් තුළින් නිර්මාණය වන ප්‍රධාන හැසිරීම් රටා දෙකක් දැකිය හැකිය. එනම්,

1. සේවක සේවිකාවන් දරුවා පිළිබඳ ගොඩනගාගත් හැසිරීම් රටා.

එනම් ඔවුන් ළමුන් සමග එකට ක්‍රීඩා කරයි. ආහාර ලබාදෙයි. නින්දට යවයි. දරුවන් රැකබලා ගන්නා මෙහෙකාරියන් බවට පත්වේ. ළමුන් පිළිබඳ පරික්ෂාවෙන් සිටී. ළමුන් සහ ඔවුන්ගේ ඇඳුම් සහ පරිහරණය අනෙකුත් උපකරණ පිරිසිදු කරයි. යනාදී වශයෙනි.

2. දෙමව්පියන් විශ්වාසවන්ත තම සේවක සේවිකාවනට දරුවන් වෙනුවෙන් බලය පැවරීම.

මෙම සේවක සේවිකාවන් දරුවන් පිළිබඳ දෙමව්පියන් සමග සාකච්ඡා කරයි. එසේම දෙමව්පියන් දරුවන් පිළිබඳ විශේෂ උපදේශයන් (specific instructions) සේවක සේවිකාවන්ට සම්පාදනය කරයි.

මෙම පවුල - දරුවන් සහ සේවක සේවිකාවන් අතර සබඳතාවය මුල්ව සංස්කෘතිකකරණයක් සිදු වනු දැකිය හැකි වේ.

### *ගෘහ සේවක සේවිකාවන් දෙවැනි මවක් සේ ක්‍රියාත්මකවීම (The Domestic servants may be a mother surrogate)*

සමහර සේවිකාවන් මවගේ කාර්‍යය නිසි අයුරින් ඉටු කරනු (as a real mother substitute) දක්නට ලැබේ. නිදසුන් ලෙස "අපේ ප්‍රෝලින්" (our Fraulein) මම ඉපදීමටත් ටික කලකට පෙර සිට අප නිවසෙහි

සේවිකාව බවට පත්වූවාය. දැනට ඇය වසර 17ක් පමණ සේවය කර ඇත. ඇය අප සැම සමග ඉතා ආදරවන්ත ලෙස සහ ප්‍රසංසනීයව බැඳී සිටී. (Cherished soul in the household) අප රාත්‍රියෙහි නින්දට යාමට පෙර සුභ රාත්‍රියක් වේවා! (to kiss us good night) යන ආශිර්වාදය නොකිරීම හැර වෙන කිසිදු විපත්තිදායක දෙයක් (worse catastrophe) සිදු නොකළේය."[6]

"Lucy" යනු නීග්‍රෝ ජාතික සේවිකාවකි. (Negro servant) ඇය අපගේ සැම කටයුත්තකදීම සම්බන්ධ විය. ඇය අපගේ ඇඳුම් පිරිසිදු කර දීම, ඇඳුම් මසා දීම, ඇඳුම් පැළඳ වීම, සයනගත කරවීම, රාත්‍රී නින්ද යන තෙක් හිස පිරිමැදීම, අපගේ සපත්තු මේස් පිළිවෙළට තැබීම, ආදිය සිදුකළ අතර බොහෝවිට අපගේ යහළුවන්ට පවා ඇය ඇහුම්කන් දුන්නාය. ඇය මාගේ නියම මවට වඩා කාර්ය රැසක් මා වෙනුවෙන් ඉටු කළේය. වගකීම් රාශියක් දැරීය.

මෙවැනි සේවිකාවන් දාරක ජීවිතයේ ඉතා මුල් කාලයේ සිට ගොඩනැංවෙන ජීව විද්‍යාත්මක, අවශ්‍යතාවන් මෙන්ම, ආදරය, ආරක්ෂාව, සහ සම්මානනික වැනි අවශ්‍යතාවන් ද පූර්ණ කරයි. සමාජීය සහ වෘත්තීයමය තත්ත්වයන් පදනම් ව දරුවන් වෙනුවෙන් වගකීම් දැරීමට නොහැකි වූ මව්වරුන්ගේ කාර්ය මෙම සේවිකාවන් ඉටු කරයි. සහජාශය පදනම් වූ මාතෘත්වය සේවයක් ලෙසින් ඉදිරිපත් කිරීමට උත්සාහ ගන්නේ ඉතා සුළු පිරිසකි. ඇය දරුවාට ආදරය (Love) කරයි. අනුකම්පා (sincereness) කරන අතර නිවැරදිව තේරුම් ගනියි. (understanding) ඇයගේ උණුසුම සහ ස්වභාවික පරිසරය තුළ දරුවා වර්ධනය වේ. මේ නිසා මෙවැනි මව්වරුන් හා දරුවන් අතර පුළුල් අන්තර්ක්‍රියා ජනනයක් සිදුවේ.

සමහර දරුවන් ඉතා ඕනෑකමින් සේවක සේවිකාවන්ගේ හා දෙමව්පියන්ගේ කරුණාව ලබා ගැනීමට උත්සාහ ගනී. (greedily absorb the affection of both servants and parent) දරුවන් නිරන්තරයෙන්ම තමන්ගේ මව්වරුන් ඉතා ලස්සන අය ලෙසින් සිතයි. (mothers as beautiful ladies) එහෙත් සේවිකාවන් එසේ නොවන අය මෙන්ම පහළ පාංතික කාර්ය පද්ධතීන්හි නියැලුණු (menial work) කෙනෙකු ලෙස සිතයි.

තවද එක් නිදසුනක් පෙන්වා දිය හැකිය.[8] එනම් එක් සේවිකාවක් තම සේවය ඉටුකරන පවුලෙහි කටයුතු ඉතා විධිමත් ලෙසින් අවසානය දක්වාම කරගෙන යන්නිය. දරුවන්ගේ අවශ්‍යතාවන් ද නිසි අයුරින් තෘප්තිමත් කළාය. දිනක් සේවිකාවගේ උකුලේ සිටි දරුවා, මවගේ මිතුරියකට පෙන්වීමට ගන්නා විට දරුවා මවගේ මුහුණට පහරක් ගැසීය. මෙම සිද්ධිය මවට ලැජ්ජාවට කරුණක් විය. මෙහි දී මවට වඩා සේවිකාව දරුවාගේ මව බවට පත් වී සිටි බැව් පෙනේ. මවගේ රැකියාව ආදී ව්‍යාපාරික කටයුතු නිසා දරුවා සේවිකාව වෙත තබා ගිය අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස දරුවා මවට වඩා සේවිකාවට ආදරය කළ බැව් පෙනේ.

***පවුලෙහි රළු ක්‍රියාකාරීත්වයන් අවම කරන සාමාජිකයන් ලෙසින් ගෘහ සේවක සේවිකාවන් ක්‍රියාත්මක වේ. (The Domestic servant Act as a mitigator of the Harshness of family life)***

පවුල් පරිසරය තුළ නිර්මාණය වන ගැටලුකාරී ස්වභාවයන් අවම කිරීමට සේවක සේවිකාවන් ගේ වයඃභාව යම් දායකත්වයක් දරයි. මොවුහු සේව්‍ය පක්ෂයට සහ දරුවන්ට හිතවත්ව ක්‍රියාත්මක වේ. නිදසුනක් ලෙස "Susie" යනු එක් සේවිකාවක ගේ නමකි.[9] එම සේවිකාව දරුවාට ඉතා ආදරය කරයි. වරක් දරුවාගේ පියා ස්වකීය දරුවාට ඉතා දරුණු ස්වභාවයෙන් දඬුවම් කළේය. එවිට ඇය වේගයෙන් කෑගැසුවේ ඇගේ වගකීම පිළිබඳ අදහසිනි. ඇය ස්වාමි දියණිය වෙතට දුවගොස් මහත්තයා දරුවා මරන්නේ යැයි (master is killing the boy) කෑගැසීය. අනතුරුව පහරදීම නතර වූ අතර මෙම ප්‍රකාශනය දරුවාට හොඳින් ඇසුණි. යහළු සේවිකාවන් සවස් යාමයෙහි රසකැවිලි වර්ග, බීම වර්ග තහනම් කර තිබුණ ද දරුවන්ට හොරෙන් ඒවා ගෙනත් දෙයි.

Susan යනු ගෘහ සේවිකාවකි.[10] ඇයගේ සේවය පිළිබඳව ඇය හොඳින් සිටියාය. ඇය සේවය සලසන නිවසෙහි දරුවාගේ රිදී බඳුන (Silver cup) අස්ථානගත විය. ඒ සඳහා ඔහුට දඬුවම් ලැබෙන බැව් ඇය හොඳින් දැන සිටියාය. එය වසන් කිරීමට අවශ්‍ය අසත්‍ය තොරතුරු රැසක් ඇය ඔහුට කියා දුන් අතර ඒවා ප්‍රකාශ කරන විට තවද ශක්තිමත් ලෙසින් (stoutly coraborated) ඇය ද ඒවා තහවුරු කළේය.

තෝරා ගන්නා ලද එක් නියැදි පර්යේෂණයක දී මේ හා සමාන එක් නිදසුනක් ලැබිණි. එනම් දරුවන් සමග (අසල්වැසි දරුවන් ද ඇතුළුව) සේවිකාව ද ක්‍රීඩා කරමින් සිටියා ය. එහිදී එම නිවසෙහි දරුවා අතින් බෝලය වැදී ජනෙල් වීදුරුවක් බිඳී ගියේය. මිදුලෙහි ක්‍රීඩා කිරීමට තහනම් කර තිබූ අතර පියා රැකියාවට ගොස් ආපසු පැමිණ මේ පිළිබඳව විමසා දඬුවම් කිරීමට සූදානම් විය. එහිදී සේවිකාව තමා අතින් බිඳුනා යැයි පවසා විඳීමට සූදානම් විය. එවිට දරුවා ද ඉතා ශෝකයෙන් ඔහුගේ අතින් බිඳුණා යැයි පැවසූ අතර වීදුරුව බිඳී ගියේ කා අතින් දැයි නිවැරදිව හඳුනාගත නොහැකි විය.

මෙම අධ්‍යයන සාධකවලට අනුව මෙවැනි සේවිකාවන් දරුවන්ගේ වරදක් ඉවුකළ නොදක්කා සේ ඉවත නොසිටියි. ඔහුගේ දඬුවම් අවම කිරීමට උත්සාහ ගනී. විශේෂයෙන් දැඩි දෙමව්පියන් (stern parents) සේවිකාවන් සමග දැඩි පුළුල් සබඳතා ගොඩනොනගන්නා අතර (Hard dealings with servants) දරුවන් පිළිබඳ දැඩි විනය ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගනී. සේවක සේවිකාවන්ගේ මෙම උපක්‍රමශීලි ක්‍රියාමාර්ගයෙන් පවුලේ එම කර්කශ ස්වභාවය සඳහා යම් අස්වැසිල්ලක් (solace of conspiray) ලැබෙන බැව් පෙනේ.

### ***සේවක සේවිකාවන් දරුවන් සමග කුළුපග සබඳතා ගොඩනගා ගනී (Servants provide companionship for their children)***

සමහර සේවක සේවිකාවන් දරුවන් සමග ඉතා කුළුපග සබඳතා ගොඩනගා ගනී. මෙය ඔවුනගේ වයස් සීමාවන් අනුව වෙනස් වේ. මෙම සබඳතා නිවසේ දී, ඉන් පිටත සහ පාසලේ දී ගොඩනැගෙනු දැකිය හැකිය. මෙම සේවක සේවිකාවන් ඔවුන් නොදන්නා ළමුන් සමග සමූහගත වීමෙන් විවිධ ක්‍රියාවන් සිදු කරයි. මෙම සේවක සේවිකාවන් සහ ළමුන් එකතුව සෙල්ලම් ගෙවල් සැකසීම, ගී ගායනය, නාට්‍ය රංගන ඉදිරිපත් කිරීම, එක් එක් චරිතාංග ඉදිරිපත් කිරීම විශේෂයෙන් සත්ත්ව චරිතාංග (wild life) මෙහි දී දැකිය හැකිය.

එමෙන්ම මෙතෙක් දෙමව්පිය පවුල් පරිසරය තුළින් ලබාගත නොහැකි වූ ජීවිතයේ විවිධ පැති පිළිබඳ දැනුම සංවර්ධනය කර ගනී. නිදසුනක් ලෙස ලිංගික ජීවිතය. මේ අනුව ප්‍රායෝගික ක්‍රියාකාරකම් දෙසට නැඹුරුවීමට සේවක සේවිකාවන්ගේ රටාව ඉතා වැදගත් වේ.

***සේවක සේවිකාවන් තුළින් පවුල් පරිසරය හෙළි නො කරන සිද්ධීන් පිළිබඳ දරුවන්ගේ දැනුම වර්ධනය කර ගැනීමට හැකි වේ. (The servant may analloge a child's knowledge of many aspects of life which ate Alien to him in his own immediate family of from which his parent have carefuly protected him)***

දරුවන් සාහිත්‍ය තුළ තිබෙන විවිධ කතන්දර ඉගෙන ගනී. එක් නිදසුනක් ලෙස ඉතා ඈත දිවයිනක සිදුවුණු ක්‍රියාදාමයක් හා සම්බන්ධ වන කතන්දරයක් සැලකිය හැකිය. එම කතන්දරයෙහි අන්තර්ගතය තුළ මිනීමැරුම්, එදිනෙදා පොලිසියේ කාර්‍යයන්, සිරගෙවල් පිළිබඳ, නැව් මුහුදු බත්වීම, දුම්රිය මාර්ගයේ සිදුවන අනතුරු, යක්ෂයන් පිළිබඳ කතන්දර ආදිය දැකිය හැකි අතර ජීවිතයේ විවිධ පැති හා සම්බන්ධවන අරුම පුදුම දේ ලෙස (oddity of life) අසාගෙන සිටියි. මගේ දෙමව්පියන් සහ සහෝදරයන් මෙවැනි වීර ක්‍රියාවන් සිදු නොකරන බැව් ඔවුහු සිතති.

සේවක සේවිකාවන්ගේ කාමරයෙහි වැඩිහිටි ක්‍රියාකාරකම් දක්වෙන බිත්ති අලංකාරය සඳහා සකසා ඇති පින්තූර ආදිය දේ තුළින් බොහෝ දේ ඉගෙන ගනී. මෙහිදී ඔව්හු කැමැත්ත දක්වන නළු නිළි පිංතූර, අඩ නිරුවත් පිංතූර ආදී දේ දක්නට ලැබේ.

දෙමව්පියන්ගේ යට ඇඳුම් බොහෝ දුරටම දරුවන්ට නො පෙනෙන සේ තබයි. එහෙත් සේවක සේවිකාවන් එසේ නොවන අතර දරුවන් ද ඒ පිළිබඳව ඉතා විමසිලිමත්ව බලයි.

සේවක සේවිකාවන් ලෙස කටයුතු කිරීමේ දී ඔවුනගේ හිතුමතය අනුව කටයුතු කරන අවස්ථා ඇත. මේ නිසා විවිධ ගැටළු අවස්ථාවනට මුහුණදීමට ද සිදු වේ. Mary යනු සේවිකාවක් වූ අතර විවාහ නොවූ කාන්තාවකි.[11] මද කලකට පසු ඇය ගැබ්ගෙන දරුවෙකු බිහිකිරීමේ තත්ත්වයට පත් විය. මේ තුළින් දරුවන් නිවැරදි නොවන අත්දැකීමක් වන අවජාතක (illigitimacy) පිළිබඳ දැනුම ලබා ගත්තේය.

***සේවක සේවිකාවන්ගේ පෞරුෂය සම්බන්ධ සාධක දාරක සමාජානුයෝජනය සඳහා බලපායි. (The servants often personalities A social Type to the child)***

සේව්‍ය- සේවක අතර නිර්මාණය වන පන්ති වෙනස පෞරුෂ සාධනය සඳහා ප්‍රබලව බලපායි. නිදසුන් ලෙස ඇමරිකාවේ මේ පිළිබඳව කරන ලද සමාජ විද්‍යාත්මක පර්යේෂණ පෙන්වා දිය හැකිය.[12] එනම් ඇමරිකාවේ සේවක සේවිකාවන් ලෙස බොහෝ දුරට බඳවා ගන්නා ලද්දේ නිග්‍රෝ (Negro) ජාතිකයන් ය. මෙම සේවක සේවිකාවන් සපයන සේවය සඳහා ඔවුන්ගේ පෞරුෂ රටාව බලපානු ලබයි. දරුවන් සමග බොහෝ හිතවත්කම් නිර්මාණය කරගන්නා මොවුනගේ පෞරුෂ රටාවේ බොහෝ අංග ළමා සමාජානුයෝජන සඳහා හේතු වේ. මේ පිළිබඳ පුළුල් න්‍යායාත්මක තත්ත්ව ඔස්සේ විග්‍රහ කරන විට පර්යේෂකයන් පෙන්වා දී ඇත්තේ මෙම පහළ සමූහයේ (minority group) පෞරුෂ රටා පදනම පමණක් නොව ඔවුන් හා මහ පවුල සම්බන්ධ වීමෙන් ගොඩනැංවෙන පෞරුෂ රටාව ද මෙහි දී බලපාන බවයි.

***ගෘහ සේවක සේවිකාවන් දරුවන්ගේ ලිංගික ජීවිතය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සහ ඒ සඳහා පෙළඹවීම් ද කරයි. (Servants may influence the sex life of children)***

ගෘහ සේවක සේවිකාවන් තුළින් දරුවන්ට ලිංගික දැනුම මෙන්ම ලිංගික අත්දැකීම් ද ගලා ගනු ලබයි. එක් ආත්ම චරිත කථනයක සඳහන් වන්නේ ලිංගික ජීවිතය සහ දරුවන් ලැබීම පිළිබඳ හැඟීම මගේ දෙමව්පියන් හෝ මාමා වත් දැනුවත් නොකළ බවත් සේවිකාවන් ගෙන් ඒ පිළිබඳ දැනුම ගලා ආ බවත් ය.[13]

සමහර සේවිකාවන් දරුවන්ට ඉතා ඕනෑකමින් ආදරය කරයි. (purely ideal level) සේවිකාවන් ඓහලෞකික වින්දනය ද (profane love) ලබා ගනී. දරුවන් උකුලේ තබා නලවන්නේ ද ඉතා ආශාවෙනි. දරුවන් ද ඔවුනට ආදරය කරයි. මෙලෙස ගොඩනැංවෙන ආදරය සහ ඒ හා බැඳෙන චර්යාවන් බොහෝ අවස්ථාවන්හි දක්නට ලැබේ. මෙම ආදර සබඳතා ගොඩ නැගෙන්නේ ඔහුගේ මවට ආදරය කරන්නා හා සමාන

ලෙසිනි. (similar passion for his mother) එසේම එවැනි අවස්ථාවන්හි දී පියා සමඟ දැඩි වෛරී තත්ත්වයක් ද ගොඩනොනගා ගනී.

ලොව බොහෝ රටවල පිරිමි දරුවන්ට මුල් කාලයේ දී ම ලිංගික අත්දැකීම් ලබා ගැනීමට හැකිවන්නේ නිවසෙහි ජීවත් වන සේවක සේවිකාවන් පදනම් කර ගෙන බැව් සඳහන් වේ.[14] මෙම මුල් කාලයේ දී ලබන අත්දැකීම් දිගු කාලීනව ගලායාමක් ද සිදු වේ. විශේෂයෙන් ගොවි පොලවල්වල සේවය කරමින් ජීවත් වන සේවිකාවන් මේ සඳහා පෙළඹෙන බැව් පර්යේෂණ තුළින් සොයාගෙන ඇත. වයස අවුරුදු 10-20 අතර දරුවන් මෙම අත්දැකීම් ලබා ගනී. මෙම තත්ත්වය සම ලිංගික සේවනය සඳහා (Homosexual) මෙන්ම විරුද්ධ ලිංගික ඇසුර තෘප්තිමත් කිරීමට අවශ්‍ය (Heterosexual) පාදක පසුබිම නිර්මාණය කරයි.

***ගෘහ සේවක සේවිකාවන් සමාජ පන්තිය, පන්ති සංස්කෘතිය හා පන්ති ගැටුම පිළිබඳව ආකල්ප සංවර්ධනය කරයි. (Servants in the home can give children in introduction to the meaning of class status, class culture and class strite and help to mold their attitude about these things)***

ගෘහ සේවක සේවිකාවන් තුළින් දරුවන්ට කුඩා කාලයේ සිටම සමාජ අසමානතාවය හෙවත් පන්ති වෙනස්කම් පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට හැකි වේ. එක් නිදසුනකට අනුව ඔවුන් කිසිදිනක රසවත් ආහාරයක් අනුභව කර නැත. සමහරුන් ප්‍රකාශ කළේ වැඩි වැඩ කොටසක් ගෙන සුළු වැටුපක් ගෙවන බවයි. එසේම මෙහෙකරුවන්ගේ වැඩවල ද කොටස්කරුවන් වෙමින් වැටුප අඩු කිරීමට සේව්‍ය පක්ෂය උත්සාහ දරන බවයි.[15] හාම්පුතුන් සේවක සේවිකාවන්ගේ පෞද්ගලික ජීවිතයේ සියලු ක්‍රියා පාලනය කරයි. සේවිකාවන්ට හාම්පුතුන් හා රාත්‍රිය ගත කිරීමට අණ ලැබෙන අතර එය ප්‍රතික්ෂේප කළ විට වැඩි වැඩ කොටස් පැවරීමෙන් හා ඇයව සැලකිල්ලට නො ගැනීමෙන් දඬුවම් ලබා දෙයි.

සමහර දරුවන් දෙමව්පියන්ගෙන් එම පහළ පාන්තික මෙහෙකාරියනට ඇඳීමට වස්ත්‍ර ආහාර පානාදිය හොරෙන් ගෙනත් දෙන අතර දුප්පත්වීමට ඉඩ නොහරින මෙන් මවගෙන් ද ආයාචනා කරන ළමුන් සිටියි. මේ තුළින් දරුවාගේ මනසෙහි පන්ති විඥානිකත්වය (Class conciousness) නිර්මාණය වී ඇති බැව් පැහැදිලි ය.

***සේවක සේවිකා ක්‍රියා රටා පදනම්ව දරුවා තුළ බිය හා අනාරක්ෂිත හැඟීම් නිර්මාණය වේ. (Servants in ignorance can still deep fears in children which make for insecurity and timidity)***

බුද්ධි හීන සේවක සේවිකාවන්ගේ (foolish servants) ක්‍රියා රටා පදනම් ව දරුවා තුළ නොසැලකිලිමත් බව බිය සංකා ආදිය නිර්මාණය වන බව දැකිය හැකිය.[16] දරුවන්ට බිය ගෙන දෙන කතාන්තර සේවක සේවිකාවන් විසින් කියා දෙනු ලබයි. එම අවස්ථාවල දී අසා සිටියත් එම අත්දැකීම් පදනම්ව පසුව බිය සිතෙයි. බිය සිතට කාවදින චර්යාවන් ද ඔවුන් ඉදිරිපත් කරයි. වරදක් කළ හොත් දඬුවම් කරන්නේ යැයි ද බිය කරවයි. “බිල්ලන්ට දෙනවා” “රකුසන්ට දෙනවා” යැයි යනාදී වශයෙන් ජනශ්‍රැතික නිර්මාණ ළමා චර්යාව ගොඩනැංවීම සඳහා උපයෝගී කරගනී. අධිස්වාභාවික බලවේග (Super natural forces) පදනම් ව ද බිය කිරීම සිදු කරයි. මේ සඳහා සංස්කෘතික සාධක වල බලපෑම මෙන්ම සේවක සේවිකාවන්ගේ බුද්ධිමත් බව හේතු වේ. එමෙන්ම සේවක සේවිකාවන්ගේ සැකසුණු පෞරුෂ රටාව ද මෙහිදී වැදගත් වේ.

මේ අනුව සේවක සේවිකාවන් ළමා සමාජානුයෝජනය සඳහා හිතකර ආකාරයෙන් මෙන්ම අහිතකර තත්ත්වයන්ගෙන් ද බලපෑම් කරයි. කෘත්‍යාත්මක සාධකවලට වඩා දුෂ්කෘත්‍යාත්මක සාධක දක්නට ලැබීම. මෙයි විශේෂ ලක්ෂණයයි. සමාජ පන්තිය පිළිබඳ හැඟීම, ලිංගික ජීවිතය පිළිබඳ හැඟීම සහ ඒ පිළිබඳ පෙළඹවීම්, බිය සංකාව පිළිබඳ හැඟීම, ජීව විද්‍යාත්මක අවශ්‍යතාවන්හි නිසි සංතෘප්තියක් නොලැබීම ආදිය පදනම් ව බිඳුණු පෞරුෂ රටා නිර්මාණයක් සඳහා හේතුන් දැකිය හැකිවේ. මේ පිළිබඳව වැඩිහිටියනට සහ දෙමව්පියනට නිසි අවබෝධයක් ද නොමැත. මෙම අනවබෝධිත බව, සමාජ සංකීර්ණ

ස්වභාවය හා කාර්යභාර ගැටුම ආදී තත්ත්ව පදනම්ව ගෘහ සේවක සේවිකාවන්ගේ අවශ්‍යතාවය ද වර්ධනය වෙමින් පවතී. මෙම සේවක සේවිකාවන් අතීත සමාජය මෙන් නොව සේවා පරමාර්ථයට වඩා ආත්මාර්ථකාමී, වාණිජ පදනම් මුල්ව ක්‍රියාත්මක වන බැව් පෙනේ.

*පාදක සටහන :*


1. Bossard, James, H. S., Stoker Boll Eleanor, 1960, The sociology of child development, Harper and Brothers Publishers, New York PP. 182-198 ;

2. Ibid - 1960 - P. 182 ;

3. Ibid - 1960 - P. 183 ;

4. Ibid - 1960 - P. 184 ;

5 Allison Davis, B. B. Gardner and Mary R. Gardner, 1941, Deep south, University of chicago press, chicago, P. 445 ;

6. Bossard, James, H. S. Stoker Boll Eleanor, 1960, Op. cit,

7. 8. Ibid - 1960 - P. 187 ;

9. 10. Ibid - 1960 - P. 188 ;

11. Ibid - 1960 - P. 190 ;

12. Ibid - 1960 - P. 193 ;

13. Ibid - 1960 - P. 190 ;

14. 15. Ibib - 1960 - P. 192 ;

16. Ibid - 1960 - P. 193 ;